# <u>සංගීත තරග සඳහා අදාළ කොන්දේසි</u>

## (පොදු උපදෙස් හා කොන්දේසිවලට අමතරව බල පැවැත්වේ.)

1. වයස් සීමාව දක්වා නොමැති තරග ශීර්ෂ සඳහා සහභාගීවිය හැක්කේ වයස අවුරුදු 12- 23ත් අතර තරගකරුවන්ට පමණි. සහය වාදන කටයුතු සඳහා සහභාගී වන ආචාර්යවරු හා කලායතනාධිපතිවරුන් සම්බන්ධයෙන් මෙම වයස් සීමාව බල නොපායි.
2. එක් කලායතනයක් සඳහා ඒකල තරග ඉසව් 03 ක් සහ සමූහ තරග ඉසව් 02 ක් වශයෙන් උපරිමය තරග ඉසව් 05 කි. (ඒකල තරග ඉසව් සඳහා එක් තරගකරුවෙකුට තරග ශීර්ෂ දෙකකට පමණක් ඉදිරිපත් වීමට අවස්ථාව දෙනු ලැබේ. එම තරගකරුවන්ට සමූහ තරගවලට ඉදිරිපත් විය හැකිය . )
3. එක් එක් තරග ඉසව් සඳහා අදාල කාලසීමාව නොඉක්මවා යාමට තරගකරුවන් වගබලා ගතයුතු අතර, එසේ කාලය ඉක්මවා යන තරග අංක ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය විනිශ්වය මණ්ඩලය සතුය.
4. සංගීත තරග සඳහා අදාළ කාල සීමාවන් සහ ශිල්පීන් සංඛ්‍යාව නිර්ණායකයන් හි දක්වා ඇත.
5. කොවිඩ් වසංගත තත්ත්වය යටතේ සමූහ තරග ශීර්ෂ සඳහා සහභාගීවිය හැකි උපරිම තරගකරුවන්ගේ සංඛ්‍යාව 15 කට සීමා කිරීමට සිදුවී ඇති බව සැලකිය යුතුයි.
6. ශාස්ත්‍රීය ඒකල හා සමූහ ගායන වාදන අංග සඳහා ඉලෙක්ට්‍රොනික තාම්පුරාව භාවිත කළ හැකි අතර, එය තරගය සඳහා සහභාගී විය හැකි සංඛ්‍යාවට අදාල කරගනු නොලැබේ.
7. ශාස්ත්‍රීය රාගධාරී ඒකල ගායන තරග ශීර්ෂවලදී ස්වර වාද්‍ය භාණ්ඩයක් සහය කර ගත හැක්කේ ශ්‍රැති වාදනය සඳහා පමණි.
8. එක් එක් තරග ශීර්ෂ සඳහා උචිත ඇඳුම් පැළඳුම් භාවිත කළ හැකිය. ලකුණු ලබාදීමේදී ඒ සඳහා විශේෂ ඇගයීමක් සිදු නොකෙරේ.
9. අංක,13, සඳහා ඕනෑම සංගීත භාණ්ඩයක් යොදා ගත හැකිය.

   විදුලි ඕගනය භාවිත කරන්නේ නම් කලින් සකස් කරන ලද සංගීත ඛණ්ඩ භාවිත කළ නොහැකි අතර, සජීවීව වාදනය කළ යුතුය.